# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2022

## ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

### ලියාපදිංචියට තෝරා ගැනීම සඳහා අයදුම් කිරීමේ සුදුසුකම්

1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2000 වසරේ හෝ ඉන්පසු පවත්වන ලද අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් ප්‍රධාන විෂයන් තුනම එකවර සමත් වී තිබීම

   හෝ

   2000 වර්ෂයට පෙර අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට පෙනී සිට විෂයයන් හතරම එකවර සමත් වී තිබීම

   හෝ / සහ

2. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගත් මතු දැක්වෙන වෙනත් සුදුසුකම්

   I. පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් උපාධියක් ලබා තිබීම
   II. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් හෝ ශ්‍රී ලංකාවේ පිළිගත් වෙනත් විශ්වවිද්‍යාලයක් මඟින් පිරිනමනු ලබන උසස් ඩිප්ලෝමා පාඨමාලාවකින් සමත් වී තිබීම (SLQF level 4/ NVQ Level 6)
   III. ඩිප්ලෝමා පාඨමාලාවකින් සමත් වී තිබීම (SLQF level 3 / NVQ Level 5)
   IV. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු සහතිකය ලබා තිබීම
   V. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසාන නීති පරීක්ෂයෙන් සමත් වී තිබීම
   VI. වෙනත් අදාළ සුදුසුකම් (ප්‍රාචීන විභාග, විශාරද, ධර්මාචාර්ය හෝ සමාන වෙනත් අධ්‍යාපනික සුදුසුකම්)

### පාඨමාලාවේ ගාස්තු

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාවේ ගාස්තු පහත පරිදි වේ.

| ගාස්තුව | මුදල (රුපියල්) | ගෙවිය යුතු කාල සීමාව |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තුව | 15,000.00 | ලියාපදිංචි ගාස්තු හා පාඨමාලා ගාස්තු පළමු වාරිකය ලියාපදිංචි වන අවස්ථාවේදී ගෙවිය යුතුය. |
| පාඨමාලා ගාස්තු (පළමු වාරිකය) | 40,000.00 | |
| පාඨමාලා ගාස්තු (දෙවන වාරිකය) | 30,000.00 | විශ්වවිද්‍යාලය මඟින් දැනුවත් කරන කාලසීමාව තුළදී ගෙවිය යුතුය. |
| පාඨමාලා ගාස්තු (තුන්වන වාරිකය) | 30,000.00 | |

❖ පාඨමාලා ගාස්තු අයකරනුයේ සමස්ත උපාධි පාඨමාලාව සඳහා වන අතර උපාධි I පරීක්ෂණයට අයදුම් කිරීමට පෙර ඉහත සියලුම (ලියාපදිංචි හා සියලු වාරික 1,2,3) ගාස්තු ගෙවා අවසන් කර තිබීම අනිවාර්ය වේ. ගෙවීම් සම්පූර්ණ කර නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණ සඳහා පෙනී සිටීමට අවකාශය නොලැබේ.

❖ ඉහත ගෙවීම්වලට අමතරව විභාග ගාස්තු සහ උපාධි ප්‍රදානෝත්සව ගාස්තු අදාල පරිදි ගෙවීමට සිදුවේ.

## ලියාපදිංචිය සඳහා තෝරා ගැනීමේ

01. 2021 ජනවාරි 15 දිනැති අංක 01/2021 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව මෙම උපාධි පාඨමාලාව සඳහා තෝරාගනු ලබන්නේ සීමිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් බැවින්, ලියාපදිංචිය සඳහා තෝරා ගැනීමේදී පහත ක්‍රමවේදය අනුගමනය කරනු ලැබේ.

   I. 2000 වසර හෝ ඊට පසු අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල සහිත අයදුම්කරුවන් තෝරා ගැනීමේදී **Z** අගය සැලකිල්ලට ගනු ලැබේ.

   II. 2000 වසරට පෙර අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල සහිත අයදුම්කරුවන් තෝරා ගැනීමේදී විෂයය හතරට ලබාගෙන ඇති මුළු ලකුණු සැලකිල්ලට ගනු ලැබේ.

   III. වෙනත් සුදුසුකම් යටතේ අයදුම් කර ඇති අපේක්ෂකයින් තෝරා ගැනීමේදී පරීක්ෂක මණ්ඩලයක් මගින් එක් එක් සුදුසුකම් සඳහා පිරිනමන ලකුණු පදනම් කර ගනු ලැබේ.

## විෂයයන් තෝරා ගැනීම

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන සෑම අපේක්ෂකයෙකුම ප්‍රධාන විෂයයන් 03 ක් සහ ඊට අමතරව පහත සඳහන් අනිවාර්ය පාඨමාලා ඒකක සමත්වීම අත්‍යවශ්‍ය වේ.

### අනිවාර්ය පාඨමාලා ඒකක

| වසර | පාඨමාලා කේතය | පාඨමාලා ඒකකයේ නම |
|---|---|---|
| පළමු වසර | GENG1005 | English in use I |
| | GEIT1001 | Introduction to Information and Commiunication Technology |
| | SOFT1001 | ශ්‍රී ලාංකේය සමාජය |
| දෙවන වසර | GENG1001 | English in use II |
| | GEIT2005 | Microsoft Office for Workplace Productivity |
| | SOFT2001 | නායකත්වය හා පෞරුෂ සංවර්ධනය |
| | GWBT2002 | Work Based Training |
| තෙවන වසර | GENG2001 | English for General Purpose |
| | GEIT3005 | Data Visualizations and Management |

**තෝරාගත යුතු පාඨමාලා ඒකක**

2021 ජනවාරි 15 දිනැති අංක 01/2021 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව මෙම උපාධි පාඨමාලාවට අදාළ තෝරාගත යුතු විෂයයන් පහත දැක්වෙන පරිදි විෂයය කාණ්ඩ 03 ක් යටතේ වර්ගීකරණය කර ඇත.

| **01 කාණ්ඩය** Basket 1 | **02 කාණ්ඩය** Basket 2 | **03 කාණ්ඩය** Basket 3 |
| --- | --- | --- |
| ❖ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය<br>❖ ඉතිහාසය<br>❖ දේශපාලන විද්‍යාව<br>❖ මනෝවිද්‍යාව<br>❖ සිංහල<br>❖ සමාජ විද්‍යාව | ❖ පුරාවිද්‍යාව<br>❖ අපරාධ විද්‍යාව<br>❖ ආර්ථික විද්‍යාව<br>❖ භූගෝල විද්‍යාව<br>❖ ජාත්‍යන්තර සම්බන්ධතා<br>❖ පාලි<br>❖ සමාජ සංඛ්‍යානය | ❖ මානව විද්‍යාව<br>❖ බෞද්ධ ශිෂ්ටාචාරය<br>❖ බෞද්ධ දර්ශනය<br>❖ සංස්කෘතික හා සෞන්දර්ය අධ්‍යයනය<br>❖ නර්තනය<br>❖ නාට්‍ය රංගකලාව<br>❖ හින්දි<br>❖ සංගීතය<br>❖ දර්ශනය<br>❖ සංස්කෘත<br>❖ ජපන් |

උක්ත වර්ගීකරණය අනුව විෂයයන් තෝරා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රමවේදයන්ගෙන් එකක් අනුගමනය කළ යුතුය.

**** ඔබගේ පහසුව සඳහා මේ සම්බන්ධයෙන් සකස් කරන ලද වීඩියෝවක් 2022.09.25 දින සිට වෙබ් අඩවියෙහි පල කරන අතර එම වීඩියෝව පරිශීලනය කර අයදුම්පත් පිරවීම නිවරදිව සිදු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.**

**ක්‍රමවේදය 01 - :**

**ඔබ පළමු, දෙවන හා තෙවන විෂයය කාණ්ඩයන්** (Basket 1,2 & 3) **සඳහා මනාප ලබා දිය යුතුය. සෑම විෂයය කාණ්ඩයකම** (Basket 1,2 & 3) **සියලු විෂයයන් සඳහා මනාප ලබා දීම අනිවාර්ය වේ.**

**ඔබ සුදුසුකම් ලබන ආකාරය අනුව ක්‍රමවේදය 01 යටතේ පළමු, දෙවන හා තෙවන විෂයය කාණ්ඩයන්ගෙන් එක් විෂයය බැගින් හිමිවේ.**

උදාහරණය - ක්‍රමවේදය 01 / **Method 01**

Basket 1 - 1 සිට 6 දක්වා මනාප ලබා දිය යුතුය.
Basket 2 - 1 සිට 7 දක්වා මනාප ලබා දිය යුතුය.
Basket 3 - 1 සිට 11 දක්වා මනාප ලබා දිය යුතුය.

## Preference for Subjects:

**Basket 1:**

| Subject | Preference |
|---|---|
| Communication and Media Studies | 3 |
| History | 4 |
| Political Science | 2 |
| Psychology | 5 |
| Sinhala | 1 |
| Sociology | 6 |

**Basket 2:**

| Subject | Preference |
|---|---|
| Archeology | 4 |
| Criminology | 1 |
| Economics | 5 |
| Geography | 2 |
| International Relations | 3 |
| Pali | 7 |
| Social Statistics | 6 |

**Basket 3:**

| Subject | Preference |
|---|---|
| Anthropology | 1 |
| Buddhist Civilization | 3 |
| Buddhist Philosophy | 2 |
| Culture and Aesthetic Studies | 5 |
| Dancing | 11 |
| Drama and Theatre | 6 |
| Hindi | 7 |
| Music | 9 |
| Philosophy | 4 |
| Sanskrit | 10 |
| Japanese | 8 |

- ඔබ විසින් ක්‍රමවේදය 01 (Method 01) තෝරා ගන්නේ නම් එක් එක් කාණ්ඩය යටතේ ඇති විෂයයන් සඳහා තම මනාපය පරිදි 1,2,3 ආදී වශයෙන් ලකුණු කළ යුතුය.

- ඉහත සටහනට අනුව **සිංහල, අපරාධ විද්‍යාව සහ මානව විද්‍යාව** පළමු කැමැත්ත වශයෙන් තෝරා ගෙන ඇත. පළමු කැමැත්ත ලකුණු කළ විෂයය හැදෑරීම සඳහා ඔබ සුදුසුකම් නොලදහොත් 2 වන මනාපය සටහන් කළ විෂයය තෝරා ගැනීමට සිදුවේ. එයට ද සුදුසුකම් නොලදහොත් 3 වන මනාපය ලකුණු කළ විෂයය ලැබේ.

**<u>ක්‍රමවේදය 02</u> - :**

**ඔබ පළමු හා දෙවන විෂයය කාණ්ඩයන්** (Basket 1 & 2) **සඳහා මනාප ලබා දිය යුතුය. සෑම විෂයය කාණ්ඩයකම** (Basket 1 & 2) **සියලු විෂයයන් සඳහා මනාප ලබා දීම අනිවාර්ය වේ.**

**ඔබ සුදුසුකම් ලබන ආකාරය අනුව ක්‍රමවේදය 02 යටතේ පළමු විෂයය කාණ්ඩයෙන් එක් විෂයයක් සහ දෙවන විෂයය කාණ්ඩයෙන් විෂයයන් දෙකක් බැගින් හිමිවේ.**

උදාහරණය - ක්‍රමවේදය 02 / **Method 02**

Basket 1 - 1 සිට 6 දක්වා මනාප ලබා දිය යුතුය.
Basket 2 - 1 සිට 7 දක්වා මනාප ලබා දිය යුතුය.

## Preference for Subjects:

**Basket 1:**

| | |
|---|---|
| Communication and Media Studies | 3 |
| History | 4 |
| Political Science | 2 |
| Psychology | 5 |
| Sinhala | 1 |
| Sociology | 6 |

**Basket 2:**

| | |
|---|---|
| Archeology | 4 |
| Criminology | 1 |
| Economics | 5 |
| Geography | 2 |
| International Relations | 3 |
| Pali | 7 |
| Social Statistics | 6 |

- ඔබ විසින් ක්‍රමවේදය 02 (Method 02) තෝරා ගන්නේ නම් පළමු විෂයය කාණ්ඩය (Basket 1) යටතේ තම මනාපය පරිදි 1,2,3 ආදී වශයෙන් සටහන් කළ යුතුය. දෙවන විෂයය කාණ්ඩය (Basket 2) යටතේ විෂයයන් දෙකක් තෝරා ගත යුතු හෙයින් තම මනාපය පරිදි 1,2,3 ආදී වශයෙන් සටහන් කළ යුතුය.

- ඉහත සටහනට අනුව **සිංහල, අපරාධ විද්‍යාව සහ භූගෝල විද්‍යාව** වශයෙන් තෝරා ගෙන ඇත. ඒ අනුව දෙවන විෂයය කාණ්ඩය යටතේ ඔබගේ මනාපය පරිදි මුලටම ලකුණු කර ඇති 1,2 විෂයයන් සඳහා සුදුසුකම් නොලැබුවහොත් 3,4 ලෙස මනාප සටහන් කළ විෂයයන් දෙක තෝරා ගැනීමට සිදුවේ. ඒවායින් එක් විෂයයක් හෝ හැදෑරීමට සුදුසුකම් ලබා නොමැති නම් 5,6,7 ආදී වශයෙන් මනාප ලකුණු කර ඇති විෂයයන් තෝරා ගැනීමට සිදුවේ.

- එක් එක් කාණ්ඩ යටතේ ඇති විෂයයන් සඳහා බඳවා ගනු ලබන්නේ සීමිත අපේක්ෂකයින් සංඛ්‍යාවක් පමණි. යම් විෂයයකට සීමාව ඉක්මවා ඉල්ලුම් කර ඇති අවස්ථාවන්වලදී ඉහළම **Z** අගය සහිත අයදුම්කරුවන්ට අවස්ථාව හිමිවේ. යම් විෂයයක් පළමු මනාපය (1) වශයෙන් තෝරා ඇති අයදුම්කරුවෙකු ඊට සුදුසුකම් නොලැබුවහොත් ඔහු හෝ ඇය විසින් එම විෂයය කාණ්ඩය යටතේ ඉල්ලා ඇති දෙවන මනාපය (2) සහිත විෂය ලබා දෙනු ඇත. එම විෂයය හැදෑරීමටද සුදුසුකම් නෙලැබුවහොත් තුන්වන මනාපය (3) සටහන් කරන ලද විෂයය ලබා දෙනු ලැබේ. එබැවින් එක් එක් විෂයය සඳහා මනාප ලකුණු කිරීමේදී ඉතා කල්පනාකාරී විය යුතුය.

- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය අයදුම්කරන්නන් අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණයේ, අංක 29 යටතේ ඇති සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය සඳහා පෙනී සිට සමත් වී තිබිය යුතුය.

❖ නර්තනය හා සංගීතය යන විෂයයන් අයදුම්කිරීමේදී පහත සඳහන් කොන්දේසි අදාළ වේ.

**නර්තනය විෂයය**

- අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණයට පෙනී සිට නර්තනය (දේශීය) විෂයය අංක 52 යටතේ එම විෂයයට “A” සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
- සීමිත සංඛ්‍යාවක් බඳවා ගන්නා බැවින් අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිට සමත් විය යුතුය.
- නර්තනය විෂයය හැදෑරීම සඳහා උක්ත සඳහන් සුදුසුකම් හැර වෘත්තීය නිපුණතා හෝ වෙනත් සුදුසුකම් සලකා බලනු නොලැබේ.

**සංගීතය විෂයය**

- අ.පො.ස (උ/පෙළ) පරීක්ෂණයට පෙනී සිට සංගීතය විෂයය අංක 54,55 සහ 56 යන විෂයයන්ගෙන් අවම වශයෙන් “S” සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
- සීමිත සංඛ්‍යාවක් බඳවා ගන්නා බැවින් අධ්‍යයනාංශය විසින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිට සමත් විය යුතුය.
- භාත්ඛණ්ඩේ සංගීත ඩිප්ලෝමා / විශාරද පාඨමාලා / ජාතික නැටුම්, සංගීත, මධ්‍යම හෝ අවසාන පාඨමාලා හා විෂයය සමගාමී වෘත්තීය පාඨමාලාවක් සමත් වී තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

❖ උක්ත සඳහන් ක්‍රමවේදය ඔස්සේ තෝරා ගන්නා අයදුම්කරුවන් පමණක් නර්තනය හෝ සංගීතය යන විෂයයන් හැදෑරීම සඳහා තෝරා ගන්නා අතර අසමත් අයදුම්කරුවන්ට ඔවුන් විසින් දෙවන හෝ තුන්වන ආදී වශයෙන් ලකුණු කර ඇති මනාපය අනුව **වෙනත් විෂයයක් හැදෑරීමට සිදුවනු ඇත.**

## විෂයය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ පැවැත්වීම

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවේ උපාධි I ,II සහ III කොටස් සඳහා සම්පූර්ණ විෂය නිර්දේශය ආවරණය වන පරිදි විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය විසින් මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ දේශන පවත්වනු ලැබේ.

## පරීක්ෂණ සඳහා පෙනී සිටීම

සම්මන්ත්‍රණ අවසන් වූ පසු පරීක්ෂණ සඳහා වෙබ් අඩවිය ඔස්සේ පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. පරීක්ෂණ ගාස්තු හා පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ අයට පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

**** පාඨමාලා වාරික ගෙවීමේ අයදුම්පත්, සම්මන්ත්‍රණ කාලසටහන්, පරීක්ෂණ කාලසටහන්, විභාග ප්‍රවේශ පත්‍ර සහ සියලුම විස්තර වෙබ් අඩවිය ඔස්සේ පමණක් නිකුත් කරනු ලබයි.**

**දිනපතා වෙබ් අඩවිය පරිශීලනය කිරීම අනිවාර්ය වේ.**

**තැපැල් මඟින් ලිපි එවනු නොලැබේ.**

## ලියාපදිංචිය අවලංගු කිරීම

උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ පසු ලියාපදිංචිය අවලංගු කරන්නේ නම් ඔබ වෙත නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත සමග ඉල්ලීම් ලිපියක් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචිය අවලංගු කිරීමේදී ලියාපදිංචි ගාස්තු (රු.15,000.00) නැවත ගෙවනු නොලැබේ. එහෙත් **ලියාපදිංචි දින සිට සති දෙකක් ඇතුළත කරනු ලබන ඉල්ලීම් සඳහා පමණක්** ගෙවන ලද **ලියාපදිංචි ගාස්තු හැර** පාඨමාලා ගාස්තුවෙන් 10% ක් රඳවා ගෙන මුදල් ආපසු ගෙවනු ලැබේ. **මෙම කාලසීමාවෙන් පසු පාඨමාලා ගාස්තු නැවත ගෙවන ලෙස කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.**

## අයදුම්පත් යොමු කිරීමේදී සැළකිලිමත් විය යුතු කරුණු

01. අයදුම්පත් යොමු කළ හැක්කේ මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණි. ඒ අනුව external.sjp.ac.lk වෙබ් අඩවියට පිවිස නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ (Submit) යුතුය. **මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ අයදුම්කරන ලද උපාධි පාඨමාලාව ඉන් පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.**

02. අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත කළ යුතුය.

    i. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්.
    ii. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්.
    iii. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්.
    iv. බැංකුවට මුදල් ගෙවන ලද රිසිට්පතේ පිටපත. (Customer Copy)

03. ඉහත සඳහන් ලේඛනවල පිටපත් සමග සම්පූර්ණ කරන ලද අයදුම්පත (Hard copy) පහත සඳහන් ලිපිනයට 2022.10.30 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

    **(සැ. යු. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කර එවිය යුතුය.)**

    අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය ඃ

    නියෝජ්‍ය ලේඛකාධිකාරී<br>බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>තැ. පෙ. අංක 10<br>ගංගොඩවිල<br>නුගේගොඩ

04. ඔබ විසින් **ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට අදාළ ගිණුම් අංකයට 072010007119 පමණක් බැර වන පරිදි** දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට රු. 3000/- මුදලක් (ආපසු නොගෙවන) ගෙවා ලබා ගත් රිසිට් පත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. **ඔබ ඉල්ලුම් කිරීමට අපේක්ෂිත බාහිර උපාධි පාඨමාලාවේ ගිණුම් අංකයට පමණක් මුදල් ගෙවීම අනිවාර්ය වේ (බැංකු රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතු වේ).** ATM යන්ත්‍ර හෝ මාර්ගගත ක්‍රමවේදය (online) ඔස්සේ මුදල් තැන්පත් කළ නොහැක.

05. එවන ලද සියලුම ලේඛන පිටපත්වල සහතික කරන ලද අයගේ අත්සන සහ නිල මුද්‍රාව තිබීම අනිවාර්ය වේ. ලේඛන පිටපත් සහතික කළ යුත්තේ **රජයේ හෝ අනුමත කළ පාසලක ප්‍රධානියෙකු/ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකු හෝ විධායක නිලධාරියෙකු/ග්‍රාම නිලධාරීවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු හෝ රජයේ දෙපාර්තුමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක විධායක නිලධාරියෙකු** විසිනි.

06. අධ්‍යාපන සුදුසුකම් යටතේ අ.පො.ස (උ/පෙළ) සහතිකය පිළිගනු ලබන්නේ පහත සඳහන් ආකාරයටය.

- විභාග දෙපාර්තුමේන්තුව මඟින් නිකුත් කරන ලද සහතිකයේ **සහතික කරන ලද** පිටපතක්.
- පාසලේ ලිපි ශීර්ෂය යටතේ **විදුහල්පතිගේ අත්සනින් නිකුත් කරනු ලබන** සහතිකයේ සහතික කරන ලද පිටපතක්.
- **පාසල් අයදුම්කරුවන්** -අන්තර්ජාලය මඟින් ලබා ගන්නා සහතිකයේ **පාසලේ විදුහල්පති සහතික කරන ලද** පිටපතක්.
- **පෞද්ගලික අයදුම්කරුවන්** - අන්තර්ජාලය මඟින් ලබා ගන්නා සහතිකයේ **ඉහත 5හි සඳහන් නිලධාරියෙකු විසින් සහතික කරන ලද** පිටපතක්.

## අයදුම්කරුවන් සඳහා උපදෙස් ៖

***** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට අනුබද්ධ කිසිදු නියෝජිත ආයතනයක් නොමැත. එබැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස උක්ත සඳහන් ක්‍රමවේදය පමණක් අනුගමනය කළ යුතුය. වෙනත් නියෝජිතායතන හරහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.***

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- එක් අයදුම්කරුවකුට උපාධි පාඨමාලා කිහිපයකට අයදුම් කළ හැකිය. ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතු අතර අදාළ ගෙවීම් ද වෙන් වෙන් වශයෙන් අදාළ ගිණුම් අංකවලට ගෙවිය යුතුය.

- එක් එක් උපාධි පාඨමාලාවන්ට නියමිත ගිණුම් අංකයට ගෙවීම් සිදු නොකර එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2022-09-25